**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 222**

# ආයතනයේ නම : තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 222

ආයතනයේ නම - තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

| තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>**(2019, 2020, 2021 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය)**<br>**විමර්ශණය කරන ලද දිනය 2023 සැප්තැම්බර් 06** | | |
|---|---|---|
| | කමිටුව විසින් හඳුනාගත් වැරදි සහ අඩුපාඩු | ගනුලැබූ ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය පිළිබඳ පැහැදිලි කිරීම |
| 01. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව තුල අනුමත කාර්යමණ්ඩලයේ සිටිය යුතු සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂවරුන් 4 දෙනාගෙන් 2ක් පමණක් මේ වන විට ක්‍රීඩා දෙපාර්තමේන්තුවෙහි සේවය කිරීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමුවිය. | මෙම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) තනතුරු 04 න් තනතුරු 3 ක් පුරප්පාඩුව පැවති අතර, එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අනුමැතිය ලබා දෙන ලෙස අංක DSD/ADM/01/085/02 හා 2024.01.19 දිනැති ලිපියේ ඉල්ලීමට අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් 2024.04.05 දිනැතිව එම තනතුරු 03 සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ලබා දී ඇත.<br><br>ඒ අනුව ගැසට් නිවේදනය සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යොමු කරන ලද අතර, එම ගැසට් නිවේදනය සහ බඳවා ගැනීමේ ලකුණු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් 2024.07.05 දිනැතිව අනුමත කර එවන ලදි. ඒ අතර සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) තනතුරේ සේවය කරන ලද ආර්.ටී. අල්පොන්සු මහතා ද විශ්‍රාම යාම හේතුවෙන් ඉතිරි තනතුර ද පුරප්පාඩු වූ බැවින් ඒ සඳහා ද බඳවාගැනීම් සිදු කිරීමට අනුමැතිය ඉල්ලා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කරන ලද අතර, එම ඉල්ලීම අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුව වෙත යොමු කරන ලෙස දන්වන ලද හෙයින් නැවත එම ඉල්ලීමට අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සමාලෝචනය කිරීමේ කමිටුව වෙත යොමු කරන ලද නමුත් මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත.<br><br>ඒ අනුව ගැසට් නිවේදනය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ලද අනුමැතියට අනුව 2025.02.28 දිනැති 2426 අංක දරන ගැසට් පත්‍රය මඟින් අයදුම්පත් කැඳවා 2025.05.27 දිනැතිව සම්මුඛ පරීක්ෂණය පවත්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද අතර 2025.07.31 දිනැතිව ඉහත අනුමත පුරප්පාඩු 03 සඳහා නිලධාරීන් බඳවා ගන්නා ලදි. තවද එම නිලධාරීන් අතරින් එක් නිලධාරියෙකු 2025.08.03 දිනැතිව විශ්‍රාම ගෙන ඇත. |
| 02. | 2020 හා 2021 වර්ෂවල විගණකාධිපති වාර්ථාවලට අදාළව පිළියෙල කර ඇති විගණකාධිපති කෙටි සටහනේ පෙන්වා දී ඇති, ක්‍රීඩා හා | මෙම ව්‍යාපෘති වල වර්තමාන ප්‍රගතිය ඇමුණුම A සහ B මඟින් දක්වා ඇත. |

| | | |
|---|---|---|
| | යෞවන කටයුතු අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රගතිය පරීක්ෂා කිරීම. | |
| 03. | 2016 – 2017 කාල පරිච්ඡේදය තුළ රු. මිලියන 31.8 ක් වැයකර අළුත්වැඩියා කළ ටොරිංටන් හොකී ක්‍රීඩාංගණයේ ආලෝක පද්ධතියෙහි අවශ්‍යතාව පිරිවිතරවල දක්වා තිබුණද, ජාත්‍යන්තර තරග පැවැත්වීමට අවශ්‍ය උස ප්‍රමාණයන් නොමැතිවීම හා ඒ හේතුවෙන් ඉදිරියේදී පළමු පන්තියේ හොකී ක්‍රීඩා පිටියක් බවට පත්කර ගැනීමට නොහැකිවීම මෙන්ම ක්‍රීඩාංගණය භාවිතයට ගත නොහැකි මට්ටමින් පළුදු වීම / අබලන් වී පැවතීම සම්බන්ධයෙන් කාරක සභාව කරුණු විමසීය. | විදුලි ආලෝක කුලුනුවල ගැටලුවක් නොපවතින බව ඉංජිනේරු අංශය විසින් ප්‍රකාශ කර ඇත. |
| 04. | විගණකාධිපති වාර්තාවේ සඳහන් සියලු කරුණු පිළිබඳ වාර්තා කැඳවීම. | මේ සම්බන්ධයෙන් රජයේ ගිණුම් කාරක සභාවෙන් ලබාදුන් උපදෙස් අනුව පත් කරන ලද කමිටුව මගින් විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී ඇති නිරීක්ෂණ සම්බන්ධයෙන් අධ්‍යානය කර සකස් කරන ලද පිළිතුරු වාර්තාව අංක MOYS/ACC/A6/COPA-2023 III හා 2023.10.18 දිනැති ලිපිය මගින් රජයේ ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. |
| 05. | ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් | ක්‍රීඩාවේ නිරත වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රධාන වශයෙන් පාසල් මට්ටමින් සහ ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන මට්ටමින් පවත්වනු ලබන ක්‍රීඩා තරඟාවලීන් මෙන්ම ත්‍රිවිධ |

<table>
<tr>
<td></td>
<td>ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශයේ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගකීම / මැදිහත්වීම හා ඒ වෙනුවෙන් දැනට සිදු කරන්නාවූ කාර්යභාරය හා එම වගකීම් පැවරී තිබෙන නිලධාරීන් පිළිබඳව කාරක සභාව කරුණු විමසා සිටියේය.</td>
<td>හමුදාව මඟින් සංවිධානය කරනු ලබන ක්‍රීඩා තරඟාවලීන් සඳහා සහභාගී වේ. එමෙන්ම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙල සහ ජාතික තරුණ සේවා සභාව මඟින් සංවිධානය කරනු ලබන ජාතික යෞවන ක්‍රීඩා උළෙල තුළින්ද තරඟ කිරීමට අවස්ථාව ලබා ගනී.<br><br>
01. වගකීම -<br>
➢ ඉහත සඳහන් තරඟාවලි තුළින් දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන ඔවුන්ට ජාතික මට්ටමින් සහ ජාත්‍යන්තර මට්ටමින් තරඟාවලීන් සඳහා සහභාගී වීමට අවශ්‍ය පහසුකම් සලසා දීම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගකීම වේ.<br>
➢ ක්‍රීඩා පුහුණුවීම් කටයුතු වලට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගැනීම සහ අදාල පහසුකම් ක්‍රීඩකයින් වෙත ලබා දීම.<br><br>
02. මැදිහත්වීම -<br>
➢ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී ක්‍රීඩා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රීඩාවේ සංවර්ධනය වෙනුවෙන් වැඩපිළිවෙලක් සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී.<br>
➢ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන හැත්තෑ හතර (74) මඟින් ක්‍රීඩාවේ සංවර්ධනය වෙනුවෙන් සකස් කරනු ලබන කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන සංවර්ධන සැලැස්ම පිළිබඳව අධ්‍යනය කර සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දීම.<br>
➢ ජාතික තරුණ සේවා සභාව සමඟ සම්බන්ධ වී ක්‍රීඩාවේ සංවර්ධනය වෙනුවෙන් සකස් කර ඇති සැලැස්ම පිළිබඳව අධ්‍යනයක් කිරීම සහ එම සැලසුම් තුළින් ක්‍රීඩා සමාජ සහ යෞවන සමාජ වල ක්‍රීඩාව සඳහා ඒකාබද්ධ සැලැස්මක් නිර්මාණය කිරීමේ හැකියාව පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු කිරීම.<br>
➢ ත්‍රිවිධ හමුදා ක්‍රීඩා අංශය සමඟ සාකච්ඡා කර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සුදුසු පරිදි වාර්ෂික තරඟාවලින් සකස් කිරීම සහ ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා රාජකාරීමය වශයෙන් ඔවුන් මුහුණදෙන ඇතැම් ගැටළුකාරී තත්වයන් සඳහා විසඳුම් ලබා දීමට කටයුතු කිරීම.<br><br>
03. දැනට සිදු කරනු ලබන කාර්යභාරය -<br>
➢ පාසල් මට්ටමින් දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩා ශක්ති වැඩසටහන සඳහා තෝරාගනිමින් ඔවුනට මාසිකව පෝෂණ දීමනාවන් ලබා දීමට කටයුතු කිරීම.<br>
➢ ක්‍රීඩා යටිතල පහසුකම් සඳහා අවශ්‍ය ක්‍රීඩාපිටි, ක්‍රීඩා උපකරණ ලබා දීමට කටයුතු කිරීම.<br>
➢ ජාත්‍යන්තර තරඟාවලීන් සඳහා පාසල් මට්ටමින් සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ආර්ථිකමය ගැටළු සඳහා අවශ්‍ය මූල්‍යමය දායකත්වය ලබාදීම.</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| | | ➢ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන මගින් පවත්වාගෙන යනු ලබන ජාතික ක්‍රීඩා සංචිත සඳහා අවශ්‍ය මූල්‍යමය සහ යටිතල පහසුකම් සැපයීම.<br>➢ ජාත්‍යන්තර තරඟාවලින් නියෝජනය කිරීමේදී ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය ගුවන් ප්‍රවේශපත්‍ර, ආහාරපාන සහ නවාතැන් පහසුකම් වලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම.<br>➢ පිළිගත් ජාත්‍යන්තර තරඟාවලින් තුළින් ලබා ගන්නා ජයග්‍රහණයන් ඇගයීමට ලක් කිරීම.<br>➢ අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව, ත්‍රිවිධ හමුදා මගින් සංවිධානය කරනු ලබන තරඟාවලින් සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරිපාලනය යටතේ පවතින ක්‍රීඩා සංකීර්ණයන්හි යටිතල පහසුකම් ගාස්තු අයකිරීමකින් තොරව ලබාදීම.<br>➢ ජාතික සංචිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පුහුණුවීම් වලට අවශ්‍ය ක්‍රීඩා උපකරණ, ක්‍රීඩාංගණ, ශක්තිවර්ධන ශාලා පහසුකම් මෙන්ම නේවාසික පහසුකම්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සැපයීම.<br><br>**04.** වගකීම් පැවරි ඇති නිලධාරීන් -<br><br>➢ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ සියළුම නිලධාරීන් ක්‍රීඩාවේ සංවර්ධනය වෙනුවෙන් ඉහත සඳහන් කල කාර්යයන් වලදී දායකත්වය ලබාදීමට කටයුතු කරනු ලැබේ. (අධ්‍යක්ෂ ක්‍රීඩා, මූලස්ථාන ක්‍රීඩා නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්) |
| 06. | ශ්‍රී ලංකාව සහභාගිවන ජාත්‍යන්තර ක්‍රීඩා තරගවලින් පිළිබද යාවත්කාලීන තොරතුරු ලබා ගැනීම | ශ්‍රී ලංකාව සහභාගී වන ජාත්‍යන්තර ක්‍රීඩා තරඟාවලින් පිළිබඳ තොරතුරු<br><br>1. වසර හතරකට වරක් පැවැත්වෙන ඔලිම්පික් ක්‍රීඩා උළෙල<br>2. වසර හතරකට වරක් පැවැත්වෙන ආසියානු ක්‍රීඩා උළෙල<br>3. වසර හතරකට වරක් පැවැත්වෙන පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල<br>4. දකුණු ආසියානු ක්‍රීඩා උළෙල<br>5. ලෝක ශූරතා තරඟාවලින්<br>6. ආසියානු සහ පොදුරාජ්‍ය මණ්ඩලීය ශූරතා තරඟාවලින්<br>7. පැරාලිම්පික් ක්‍රීඩා උළෙල<br><br>❖ ඔලිම්පික් ක්‍රීඩා උළෙල<br><br>• 2020 වර්ෂයේදී ටෝකියෝ ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් නව දෙනෙකු (09) සහභාගී විය. නමුත් ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙම ක්‍රීඩා උළලේ ජයග්‍රහණයන් ලබා ගැනීමට නොහැකි වූ අතර පැරාලිම්පික් ක්‍රීඩා උළෙල නියෝජනය කල ක්‍රීඩක ක්‍රීඩාවන්ගෙන් ක්‍රීඩකයින් දෙදෙනෙක් පදක්කම් හිමි කර ගැනීමට සමත් විය. මෙම ක්‍රීඩා උළෙල සඳහා ක්‍රීඩා 33 ක් ඇතුලත් විය.<br><br>• 2024 පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හය දෙනෙකු (06) සහභාගී විය. මෙම ක්‍රීඩක ක්‍රීඩිකාවන් |

විසින් ජයග්‍රහණ අත්කර නොගත් අතර පැරාලිම්පික් ක්‍රීඩා උළෙල නියෝජනය කල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් එක් පදක්කමක් ශ්‍රී ලංකාවට ලබා ගැනීමට හැකිවිය. මෙම ක්‍රීඩා උළෙල සඳහා ක්‍රීඩා 32 ක් ඇතුලත් විය.

❖ **2028 ලොස් ඇන්ජලීස් ක්‍රීඩා උළෙල**

2028 ජූලි මස 14 වෙනිදා සිට ජූලි මස 28 වෙනිදා දක්වා ඇමරිකා එක්සත් ජනපදයේදී පැවැත්වීමට නියමිත ඔලිම්පික් තරඟාවලිය සඳහා ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහභාගීත්වය අපේක්ෂා කල හැකිය. මෙම ක්‍රීඩා උළෙල සඳහා ක්‍රීඩා 28 ක් ඇතුලත් කිරීමට යෝජිතය.

❖ ආසියානු ක්‍රීඩා උළෙල

- 2026 වර්ෂයේදී ජපානයේ නගෝයාහිදී පැවැත්වීමට නියමිත ආසියානු ක්‍රීඩා උළෙල සැප්තැම්බර් මස 19 වෙනිදා සිට ඔක්තොම්බර් මස 04 වෙනි දින දක්වා පැවැත්වීමට සැලසුම් කර ඇත. ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා පදනම් කර ගනිමින් ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව මඟින් ලබාදෙන නිර්දේශයන්ට අනුව ක්‍රීඩිකාවන්ගේ සහභාගීත්වය තීරණය කරනු ලබයි. මෙම ක්‍රීඩා උළෙල සඳහා ක්‍රීඩා හතලිස් එකක් (41) ඇතුලත් වේ.

- 2022 වර්ෂයේදී චීනයේ පැවති ආසියානු ක්‍රීඩා උළෙල නියෝජනය කල ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් පහත සඳහන් පරිදි පදක්කම් ලබා ගැනීමට සමත් විය.

| ආසියානු ක්‍රීඩා තරඟාවලිය පැවැත්වූ වර්ෂය | පැවති නගරය | ඇතුළත් ක්‍රීඩා සංඛ්‍යාව | ජයග්‍රහණය කරන ලද පදක්කම් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | රන් | රිදී | ලෝකඩ | එකතුව |
| 2022 | හැන්ෂවු - චීනය | 40 | 01 | 02 | 02 | 05 |

❖ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල

- 2022 වර්ෂයේදී බර්මින්හැම්හි පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල නියෝජනය කල ශ්‍රී ලාංකිය ක්‍රීඩක ක්‍රීඩිකාවන් පහත සඳහන් ක්‍රීඩා සඳහා පදක්කම් ලබා ගැනීමට සමත්විය.

| අනු අං | ක්‍රීඩක / ක්‍රීඩිකාවගේ නම | ක්‍රීඩාව/ඉසව්ව | ලබාගත් පදක්කම |
|---|---|---|---|
| 1 | යුපුන් අබේකෝන් | මලල ක්‍රීඩා - 100 m | ලෝකඩ පදක්කම |
| 2 | දිලංක ඉසුරු කුමාර | බර ඉසිලීම | ලෝකඩ පදක්කම |
| 3 | නෙත්මි අහිංසා | මල්ලවපොර | ලෝකඩ පදක්කම |

| | | |
|---|---|---|
| | | • 2026 වර්ෂයේදී ග්ලාස්ගෝහිදි පැවැත්වීමට නියමිත පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ජූලි මස 23 දින සිට අගෝස්තු මස 02 වෙනි දින දක්වා පැවැත්වීමට නියමිතය. මෙම ක්‍රීඩා උළෙල සඳහා බර ඉසිලීම ක්‍රීඩාව සඳහා සුදුසුකම් සපුරා ගැනීම කලයුතු අතර අනෙකුත් ක්‍රීඩා සඳහා ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව මඟින් ලබාදෙන නිර්දේශයන් පදනම් කර ගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගී කරවීමට අපේක්ෂා කෙරේ.<br><br>❖ දකුණු ආසියානු ක්‍රීඩා උළෙල<br><br>• 2019 වර්ෂයේදී නේපාලයේදී පැවැත්වූ දකුණු ආසියානු ක්‍රීඩා උළෙලින් පසුව මේ දක්වා මෙම ක්‍රීඩා උළෙල පැවැත්වීට අපොහොසත් වී ඇත. පාකිස්ථානයේදී පැවැත්වීමට නියමිතව ඇති මෙම ක්‍රීඩා උළෙල 2026 ජනවාරි මස 23 සිට 31 දක්වා පැවැත්වෙන බවට ප්‍රකාශ කර ඇතත් ඒ සම්බන්ධව අවසන් තීරණ මේ දක්වා ලබා දී නොමැත.<br><br>• 2019 වර්ෂයේදී මෙම ක්‍රීඩා උළෙලේදී ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් පදක්කම් සටහනේ තුන්වන ස්ථානය ලබා ගැනීමට සමත් වූයේ රන් පදක්කම් 40 ක්, රිදී පදක්කම් 83 ක් සහ ලෝකඩ පදක්කම් 128ක් ලබා ගනිමිනි. |
| 07. | අමාත්‍යාංශය සඳහා අපේක්ෂිත හා වෙන් කරන ලද වාර්ෂික පුනරාවර්ථන හා මූලධන වෙන් කිරීම් පිළිබඳව කාරක සභාව විමසා සිටියේය. එහිදී පාසල් මට්ටමින් ක්‍රීඩාවේ දියුණුව සඳහා මුදල් වෙන් කිරීම පිළිබඳව කාරක සභාවේ අවධානයට හා සාකච්ඡාවට ලක්වූ අතර, පුනරාවර්ථන වියදම් සඳහා සාපේක්ෂව වැඩි මුදලක් වැය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කලේය. | අමාත්‍යාංශ සඳහා වෙන් කරන ප්‍රතිපාදන වලින් 75% කට වඩා වැඩි ප්‍රමාණයක් වෙන් කරනු ලබන්නේ ක්‍රීඩාවේ අභිවෘද්ධිය සඳහා වේ. ඉදිරි වර්ෂ වලදී ද ක්‍රීඩාවේ අභිවෘද්ධිය සඳහා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ගැනීමට කටයුතු කර ඇත. |
| 08. | ජාතික ක්‍රීඩා සැළැස්මක් පිළියෙල නොකිරීම සහ දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු | දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු පිහිටුවීමට අදාල මූලික කටයුතු සිදුකර 2023 වර්ෂයේදී දිස්ත්‍රික් කිහිපයක කමිටු පිහිටුවීමට කටයුතු කර ඇති නමුත් ඉන් පසු එම කමිටු පිහිටුවීම නතර වී ඇත. |

| | | |
|---|---|---|
| | නොපිහිටුවීම සම්බන්ධයෙන් කාරක සභාවේ සාකච්ඡාවට භාජනය විය. | |
| 09. | ක්‍රීඩාවේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වාර්ෂික අය වැය ඇස්තමේන්තුව රු. මිලියන 500 ක් වුවද, ලිඛිතව ඉල්ලීම් රාශියක් සිදු කළද මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී තිබෙන්නේ රු.මිලියන 125 ක් පමණ බවත් මේ සඳහා කරුණු ඉදිරිපත් කළ අමාත්‍යාංශ නිලධාරීහු ප්‍රකාශ කර සිටියහ. | මෙම ව්‍යාපෘති වල වර්තමාන ප්‍රගතිය ඇමුණුම B මගින් දක්වා ඇත. |
| 10. | ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව තීරණය කිරීම සම්බන්ධයෙන් දැනුවත්භාවය ලබා ගැනීම. | යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාශයේ හිටපු ක්‍රීඩා අමාත්‍ය ගරු නන්ද මැතිව් මැතිතුමාගේ අදහස් අනුව ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව නම් කරනු පිණිස 1990 වර්ෂයේදී ත්‍රිපුද්ගල කමිටුවක් නම් කරන ලදි. එම කමිටුවට පහත නම් සඳහන් විද්වතුන් අයත් විය.<br>1. මහාචාර්ය විනී විතාරණ මහතා (සභාපති)<br>2. පණ්ඩිත ගුණපාල සේනාධීර මහතා (සාමාජික)<br>3. පණ්ඩුල ඇදගම මහතා (සාමාජික)<br><br>ඒ අනුව වොලිබෝල් ක්‍රීඩාව ජාතික ක්‍රීඩාව වශයෙන් නම් කිරීමට ඉහත කමිටුව මගින් වාර්තාවක් ගරු ක්‍රීඩා ඇමතිතුමා වෙත 1991 වර්ෂයේ දී ඉදිරිපත් කර ඇත. වොලිබෝල් ජාතික ක්‍රීඩාව වශයෙන් නම් කිරීමට එම කමිටුව මගින් හේතු පාදක වූ පහත සඳහන් කරුණු අදාළ වාර්තාවේ ඇතුලත් කර තිබුණි.<br>• එය සාම්ප්‍රදායික ක්‍රීඩාවක් වීම සහ සම්ප්‍රදායික ක්‍රීඩාවක් ලෙස විකාශනය වූ ක්‍රීඩාවක් වීම.<br>• කණ්ඩායම් වශයෙන් සහභාගී වීමට හැකි වීම.<br>• අවශ්‍ය උපකරණ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමට ඇති හැකියාව.<br>• ජනතාව අතර ප්‍රචලිත ක්‍රීඩාවක් වීම.<br>• දක්ෂතාවය මත ජයග්‍රහනය තීරණය වීම.<br>• ශාරීරික යෝග්‍යතාවය වර්ධනය කර ගැනිම සඳහා වොලිබෝල් ක්‍රීඩාව උපයෝගී වීම. |

<table>
<tr>
<td></td>
<td></td>
<td>

**එහි නීතිමය තත්ත්වය -**

වොලිබෝල් ක්‍රීඩාව ජාතික ක්‍රීඩාව ලෙස ක්‍රීඩා අමාත්‍යාංශයෙන් මේ දක්වා ගැසට් පත්‍රයක් මගින් නම් කර නොමැති අතර මේ සම්බන්ධයෙන් 2023.10.03 දින ක්‍රීසංදෙ/ආ/09/16/1 ලිපිය මගින් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පළාත් හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් විමසූ අතර එම අමාත්‍යාංශයෙන් දැනුම් දෙන ලද්දේ මේ සම්බන්ධයෙන් පසුව සොයා බලා තොරතුරු ලබා දෙන බවයි.

**ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව තීරණය කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග -**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ද මේ දක්වා නීතියානුකූල ජාතික ක්‍රීඩාව නම් කර ඇති බවට තහවුරු නොවූ බැවින් විනි විතාරණ වාර්තාවට අනුව වොලිබෝල් ක්‍රීඩාව ජාතික ක්‍රීඩාව ලෙස නම් කිරීමට සුදුසු බවට අවශ්‍ය නිර්දේශය ක්‍රීඩා අමාත්‍යාංශය මගින් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට දැනුම් දීමට කටයුතු කිරීම.

</td>
</tr>
<tr>
<td>11.</td>
<td>ශ්‍රී ලංකාව සහභාගිවන ක්‍රීඩා තරගාවලීන් පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබා ගැනීම.</td>
<td>

**01. ඔලිම්පික් ක්‍රීඩා තරඟාවලිය**

<table>
<tr><th>ඔලිම්පික් පැවැත්වූ වර්ෂය/පවත්වන වර්ෂය</th><th>පැවති/පවතින නගරය</th><th>ඇතුළත් ක්‍රීඩා සංඛ්‍යාව</th></tr>
<tr><td>2016</td><td>රියෝ - බ්‍රසීලය</td><td>28</td></tr>
<tr><td>2020</td><td>ටෝකියෝ - ජපානය</td><td>33</td></tr>
<tr><td>2024</td><td>පැරිස් - ප්‍රංශය</td><td>32</td></tr>
<tr><td>2028</td><td>ලොස්ඇන්ජලීස්-ඇමරිකා එක්සත් ජනපදය</td><td>36</td></tr>
<tr><td></td><td></td><td></td></tr>
</table>

ඔලිම්පික් ක්‍රීඩා තරඟාවලිය සඳහා සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ලබා ගන්නා පදක්කම් සංඛ්‍යාවට අනුව රටවල් ලබා ගන්නා ස්ථානයන් තීරණය වේ. ඒ අනුව 2016, 2020, 2024 ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පදක්කම් අතරට පැමිණීමට හැකියාවක් නොතිබුණු අතර පදක්කම් සටහනේ ශ්‍රේණිගත කිරීම අතරට ශ්‍රී ලංකාව ඇතුලත් නොවීය.

2020 හා 2024 වර්ෂ වලදී පැරාලිම්පික් තරඟාවලිය සඳහා සහභාගී වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් පහත සඳහන් පදිරි පදක්කම් ලබා ගැනීමට සමත් විය.

</td>
</tr>
</table>

| පැරාලිම්පික් පැවැත්වූ වර්ෂය/පවත්වන වර්ෂය | පැවති/පවතින නගරය | ඇතුළත් ක්‍රීඩා සංඛ්‍යාව | ජයග්‍රහණය කරන ලද පදක්කම් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | රන් | රිදී | ලෝකඩ | එකතුව |
| 2020 | ටෝකියෝ - ජපානය | 22 | 01 | - | 01 | 02 |
| 2024 | පැරිස් - ප්‍රංශය | 22 | - | 01 | - | 01 |

**02.** **පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරඟාවලිය**

| පොදුරාජ්‍ය මණ්ඩලීය තරඟ පැවැත්වූ වර්ෂය/පවත්වන වර්ෂය | පැවති/පවතින නගරය | ඇතුළත් ක්‍රීඩා සංඛ්‍යාව | ජයග්‍රහණය කරන ලද පදක්කම් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | රන් | රිදී | ලෝකඩ | එකතුව |
| 2018 | ග්ලාස්ගෝ-ඕස්ට්‍රේලියාව | 18 | - | 01 | 05 | 06 |
| 2022 | බර්මින්හැම් - එංගලන්තය | 19 | - | 01 | 03 | 04 |
| 2026 | බර්මින්හැම් - එංගලන්තය | 10 | - | - | - | - |

**03.** **ආසියානු ක්‍රීඩා උළෙල**

| ආසියානු ක්‍රීඩා තරඟාවලිය පැවැත්වූ වර්ෂය/පවත්වන වර්ෂය | පැවති/පවතින නගරය | ඇතුළත් ක්‍රීඩා සඛ්‍යාව | ජයග්‍රහණය කරන ලද පදක්කම් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | රන් | රිදී | ලෝකඩ | එකතුව |
| 2018 | ජකර්තා - ඉන්දුනීසියාව | 46 | - | - | - | - |
| 2022 | හැන්ෂවු - චීනය | 40 | 01 | 02 | 02 | 05 |
| 2026 | අයිචි නගෝයා - ජපානය | 41 | - | - | - | - |

**04.** ආසියානු පැරා ක්‍රීඩා උළෙල

| පැරා ආසියානු ක්‍රීඩා තරඟාවලිය පැවැත්වූ වර්ෂය / පවත්වන වර්ෂය | පැවති/පවතින නගරය | ඇතුළත් ක්‍රීඩා සංඛ්‍යාව | ජයග්‍රහණය කරන ලද පදක්කම් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | රන් | රිදී | ලෝකඩ | එකතුව |
| 2018 | ජකර්තා - ඉන්දුනිසියාව | 43 | 05 | 05 | 05 | 15 |
| 2022 | හැන්ෂවු - චීනය | 22 | 02 | 05 | 04 | 11 |
| 2026 | අයිචි නාගෝයා - ජපානය | 18 | - | - | - | - |

05. ජාතික ක්‍රීඩා සභාව සහ ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව විසින් ක්‍රීඩාවේ සංවර්ධනය වෙනුවෙන් ලබා දී ඇති යෝජනාවන්ට අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් අවශ්‍ය වැඩපිළිවෙල ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අනුව,

i. 2028 ඔලිම්පික් මෙහෙයුම් වැඩසටහන යටතේ තෝරා ගන්නා ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා විශේෂ මූල්‍ය අනුග්‍රහයක් ලබා දීමට කටයුතු කිරීම.

ii. ජාතික සංචිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා මාසික පෝෂණ දීමනාවක් ලබා දීමට කටයුතු කර ඇති අතර ජාත්‍යන්තර තරඟාවලීන් සඳහා සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් පුහුණුවීම් සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.

iii. ක්‍රීඩාවේ දෙවන පෙළක් ඇති කිරීම වෙනුවෙන් ක්‍රීඩා ශක්ති වැඩසටහන සඳහා පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා මාසිකව මූල්‍ය අනුග්‍රාහකත්වයක් ලබා දීම.

iv. පිළිගත් ජාත්‍යන්තර තරඟාවලින් තුළින් පදක්කම් ජයග්‍රහණය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ඔවුන් ඇගයීම වෙනුවෙන් මූල්‍ය අනුග්‍රහහත්වයක් ජාතික ක්‍රීඩා අරමුදල මඟින් පිරිනැමීම.

| | | |
|---|---|---|
| 12. | ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව හා එහි පරිපාලනය පිළිබඳව විශේෂ විගණන වාර්ථාවේ සඳහන් සියලු කාරණා සම්බන්ධයෙන් වාර්ථා කැඳවීම. | කාරක සභාව ලබාදුන් නියෝග අනුව ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව හා එහි පරිපාලනය පිළිබඳව විශේෂ විගණන වාර්තාවේ සඳහන් සියළු කාරණා සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාව මාගේ අංක MOYS/ACC/A6/COPA-2023 III හා 2023.10.18 දිනැති ලිපිය මඟින් රජයේ ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. |
| 13. | අධ්‍යාපන අමාත්‍යාංශය හා ක්‍රීඩා | පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සුදුසු ක්‍රීඩාවක් කෙරෙහි යොමු කිරීම සඳහා මේ වන විට ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීමේ වැඩසටහන යටතේ හඳුනාගත් පාසල් වල ශිෂ්‍ය |

| | | |
|---|---|---|
| | අමාත්‍යාංශය අතර තිබෙන සම්බන්ධීකරණය. | ශිෂ්‍යාවන්ගේ ක්‍රීඩා කෞෂල්‍යා දියුණු කිරීම සඳහා ක්‍රීඩා භාණ්ඩ බෙදා දීම සහ ක්‍රීඩාවට අදාල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු මේ වන විට කරගෙන යනු ලැබේ. මීට අමතරව දිවයින පුරා සියළුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි ක්‍රීඩාවේ නියැලෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 800 කට ආසන්න ප්‍රමාණයකට මසකට රු. 10,000/- බැගින් ක්‍රීඩා ශක්ති වැඩසටහන යටතේ දීමනාවක් ගෙවනු ලැබේ. එමගින් ඔවුන්ගේ පෝෂණය හා ක්‍රීඩා උපකරණ මිලදී ගැනීමට යම්තාක් දුරට අභිප්‍රේරණයක් සිදුවනු ඇත. |
| **තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>(2019, 2020, 2021 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය)<br>විමර්ෂණය කරන ලද දිනය 2023 ඔක්තෝබර් 20** | | |
| 01. | විගණන කෙටි සටහනෙහි 3.1 හා 3.2 ඡේදයන්හි සඳහන් ව්‍යාපෘති 26 කින් 17ක් වැඩ අවසන් කර ප්‍රමාදයක් සහිතව භාරදී තිබූ අතර ව්‍යාපෘති 19ක් ද කටයුතු අවසන්කර ප්‍රමාදයක් සහිතව භාර දී තිබූ අතර ව්‍යාපෘති 10ක වැඩ අවසන් නොකර අතර මඟ නවතා දමා තිබීම පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළේය. එම ව්‍යාපෘති නිසි ප්‍රමුඛතා සහ ශක්‍යතා අධ්‍යනයකින් තොරව ආරම්භ කර ඇති බවත් 2020, 2021 සහ 2022 වර්ෂ වලදී මෙම ව්‍යාපෘති සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රාග්ධන වියදම් බිලියන 4 කට වඩා වැය කර ඇති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. | මෙම ව්‍යාපෘති වල වර්තමාන ප්‍රගතිය ඇති ඇමුණුම A සහ B මඟින් දක්වා ඇත. |

<table>
<tr><td>02.</td><td>වයඹ පළාතේ බිංගිරිය ක්‍රීඩා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු පිළිබදවද කාරක සභාවේ අවධානය යොමු විය. එම ක්‍රීඩාංගණය කෘතිම තණතිල්ලක් සහිතව ඉදිකිරීමට යෝජනා කරනු ලැබූවද පසුව ප්‍රතිපාදන හිඟතාවය මත තණකොළ සහිත ක්‍රීඩාංගණයක් ලෙස සැකසීම සඳහා පියවර ගත් බව කාරක සභාව හමුවේ අනාවරණය විය.</td><td>බිංගිරිය ක්‍රීඩාංගනයේ 200m ධාවන පථයක්, 400m ධාවන පථයක්, ගෘහස්ථ ක්‍රීඩාංගණයක්, පිහිනුම් තටාකයක් සහ ප්‍රේක්ෂකාගාරයක් ඉදිකිරීම සඳහා සැලසුම්කර තිබුණි. එම ව්‍යාපෘති වලින් ප්‍රේක්ෂකාගාරය සහ පිහිනුම් තටාකය මෙ වන විට සම්පූර්ණයෙන් අවසන් වී කොන්ත්‍රාත්කරු විසින් දෙපාර්තමේන්තුවට භාරදී ඇති අතර 200m ධාවන පථය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2025.12.31 දිනට පෙර අවසන් කර දෙපාර්තමේන්තුවට භාරදීමට නියමිතව ඇත. 400m ධාවන පථය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා පුවත්පත් දැන්වීමක් පලකර මිලගණන් කැඳවූ අතර ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලබාදුන් නිර්දේශ වාර්තාව අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් එම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා ප්‍රසම්පාදන තීරණය ලබාගෙන තිබුණු අතර එම ප්‍රසම්පාදන තීරණය ලේකම්තුමාගේ අනුමැතියට ඉදිරිපත් කර තිබූ නමුත් එම තීරණය ලේකම්තුමා අනුමත කර කොන්ත්‍රාත්තුව පිරිනැමීමට ප්‍රථම ලංසුකරුවකු විසින් අධිකරණ ක්‍රියාමාර්ගයක් ගෙන තිබූ බැවින් එම කොන්ත්‍රාත්තුව මේ වන තෙක් අතරමඟ නතර වී ඇත. එසේම ගෘහස්ථ ක්‍රීඩාගාරයේ මූලික සැලසුම්වල සිදුවී ඇති අඩුපාඩුවක් නිසා එම ගොඩනැගිල්ලේ සවිකිරීමට සැලසුම් කර තිබුණු වහල සවිකිරීමට නොහැකි තත්වයන් උදාවී ඇත. එබැවින් එම ව්‍යාපෘතියද අතරමඟ නතරවී ඇත.</td></tr>
<tr><td>03.</td><td>වැඩ අවසන් ව්‍යාපෘතීන්ද භාවිත කිරීමේදී අඩුපාඩු තිබෙන බව නිරීක්ෂණය වීම.</td><td>වැඩ අවසන්කළ ව්‍යාපෘති වල ඉංජිනේරුවරයා විසින් පරීක්ෂාකර වැඩ සම්පූර්ණ කළ බවට වාර්තාවක් සහ භාරගැනීමේ වාර්තාවක් ඉංජිනේරුවරයා විසින් ලබාගනු ලැබේ. එම වාර්තාව ලැබුණු පසු අවසන් බිල්පත් ගෙවීමට කටයුතු යොදා ඇත.</td></tr>
<tr><td>04.</td><td>දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු සඳහා නෛතික පත් කිරීම් සිදු කිරීම</td><td>ක්‍රීඩා ශක්ති වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන්කරගෙන පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 800 කට ආසන්න ප්‍රමාණයකට රු. 10,000/- බැගින් දීමනා ගෙවීම මඟින් ඔවුන් ජාතික මට්ටමට ගෙන ඒමට සැලසුම් කර ඇත.</td></tr>
<tr><td>05.</td><td>ජාතික ක්‍රීඩා සංගම් සියල්ල කැඳවා ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී කරවීම සඳහා ක්‍රීඩකයින් සතුවිය යුතු කුසලතා මට්ටම පිළිබඳ සාකච්ඡා කර තීරණය කිරීම.</td><td>"2028 ඔලිම්පික් මෙහෙයුම" වැඩසටහන ඔස්සේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පුහුණු කටයුතු සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වීම අරමුණු කර ගනිමින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය කටයුතු කල අතර ඒ සඳහා අනුමැතිය ලැබී ඇත.<br>2026 වර්ෂයේ පැවැත්වීමට නියමිත ආසියානු ක්‍රීඩා තරඟාවලිය සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් "ඔලිම්පික් මෙහෙයුම 2028 වැඩසටහන" යටතට තෝරාගෙන ඇත. මෙම වැඩසටහන යටතේ තෝරාගත් ක්‍රීඩාවන් සඳහා එම ක්‍රීඩා වල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා පදනම් කර ගනිමින් ප්‍රධාන කාණ්ඩ 04ක් යටතේ මූල්‍ය අනුග්‍රහය ලබා දීමට තීරණය කර ඇත.<br><table><tr><th>කාණ්ඩ වර්ගය (Tiers)</th><th>ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දීමනා (රු.)</th><th>පුහුණුකරුවන්ගේ දීමනා (රු.)</th></tr><tr><td>කාණ්ඩය 01 (Tiers)</td><td>150000.00</td><td>100,000.00</td></tr><tr><td>කාණ්ඩය 02 (Tiers)</td><td>100000.00</td><td>65,000.00</td></tr><tr><td>කාණ්ඩය 03 (Tiers)</td><td>75000.00</td><td>50,000.00</td></tr><tr><td>කාණ්ඩය 04 (Tiers)</td><td>50000.00</td><td>30,000.00</td></tr></table></td></tr>
</table>

| | | |
|---|---|---|
| | | 2026 ආසියානු ක්‍රීඩා තරඟාවලිය සඳහා ඇතුලත් කර ඇති ක්‍රීඩා සම්බන්ධයෙන් අදාල ජාතික ක්‍රීඩා සංගම් / සම්මේලන කැඳවා ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව, ජාතික ඔලිම්පික් කමිටුව සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහභාගීත්වයෙන් 2025.09.10 සහ 12 යන දිනයන්හිදි විශේෂ සාකච්ඡාවක් පවත්වන ලදී. |
| 06. | දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු, පළාත් ක්‍රීඩා කමිටු හා ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු සෑදීම | දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු පිහිටුවීමට අදාල මූලික කටයුතු සිදුකර 2023 වර්ෂයේදී දිස්ත්‍රික් කිහිපයක කමිටු පිහිටුවීමට කටයුතු කර ඇති නමුත් ඉන් පසු එම කමිටු පිහිටුවීම නතර වී ඇත. |
| 07. | ක්‍රීඩා පුහුණුකරුවන් ලංකාව නියෝජනය කරමින් විදෙස් ක්‍රීඩා තරගාවලීන්වද සහභාගි වන බැවින් එම පුහුණු කරුවන්ට අවශ්‍ය නිලභාවය ලබාදීම. | ක්‍රීඩා පුහුණුකරුවන් ජාතික ක්‍රීඩා සංගම් /සම්මේලන සමඟ සෘජු සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන වල එක් කාර්යභාරයන් ලෙස පාඨමාලා සඳහා පුහුණුකරුවන්ට සහභාගීවීමට අවස්ථාව ලබාදීම, පුහුණුකරුවන් වෙනුවට ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම සහ පුහුණුකරුවන් විසින් ලබාදෙනු ලබන සේවාව සඳහා ඔවුන් ඇගයීමට ලක් කිරීම වැනි දෑ ප්‍රධාන කාර්යයන් වේ.<br>ජාත්‍යන්තර තරඟාවලීන් සඳහා පුහුණුකරුවන් සහභාගී කරවීමේදී පුහුණුකරුවන්ට අවශ්‍ය ක්‍රීඩා අමාත්‍යාංශ අනුමැතිය ලබාදීම, තරඟාවලීන් සඳහා අවශ්‍ය ගුවන් ප්‍රවේශ පත්‍ර සහ නවාතැන් පහසුකම් වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම, වීසා ලබා ගැනීමට අවශ්‍ය ලිපිලේඛණ ලබා දීම වැනි කාර්යයන් ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලැබේ.<br>එමෙන්ම ජාතික ක්රීඩා සංගම්/සම්මේලන මඟින් පුහුණුකරුවන් වෙනුවෙන් පුහුණු බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කරනු ලබන අතර ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මඟින් මූලික පුහුණු න්‍යාය සම්බන්ධව කෙටිකාලීන පාඨමාලාවක් සකස් කර ඔවුනට අවශ්‍ය පුහුණු බලපත්‍රයක් නිකුත් කිරීමට වැඩපිළිවෙලක් මේ වනවිටත් ක්‍රියාත්මක වේ. එමෙන්ම ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මඟින් පැවැත්වීමට කටයුතු යොදා ඇත. |
| 08. | දේශිය හා ජාත්‍යන්තර ක්‍රීඩා තරගාවලි පැවැත්වෙන කාල සීමාවන්ද සලකා බලා ක්‍රීඩා සම්බන්ධ වාර්ෂික දින දර්ශනයක් සකසා නොතිබීම. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සෑම වසරකම ක්‍රීඩා දින දර්ශනයක් සකස්කර ක්‍රීඩාවට සම්බන්ධ සියළුම පාර්ශවයන් වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ.<br>මෙම ක්‍රීඩා දින දර්ශනය සකස් කිරීමේදී ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන මඟින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රීඩා වැඩසටහන් මෙන්ම ජාත්‍යන්තර තරගාවලීන් පිළිබඳව දත්ත ඇතුලත් කරනු ලැබේ.<br>එමෙන්ම ත්‍රිවිධ හමුදා මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන තරඟාවලින් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ක්‍රීඩා තරඟාවලිය පිළිබඳව අවධානය යොමු කරනු ලබන අතර විශ්ව විද්‍යාල ක්‍රීඩා තරඟාවලි සහ ජාතික යෞවන ක්‍රීඩා උළෙල පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ දින දර්ශනය නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.<br>ක්‍රීඩා දින දර්ශනය සෑම වසරකම දෙසැම්බර් මස අවසානය වන විට නිකුත් කිරීම සිදු කෙරේ. |

| | | |
|---|---|---|
| 09. | පාසැල් මට්ටමින් ක්‍රීඩා කුසලතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් හදුනා ගැනීමට ගන්නා ක්‍රමවේදය පිළිබදව කාරක සභාව විමසීය. එහිදී ශාරීරික යෝග්‍යතාවය අනුව පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සුදුසු ක්‍රීඩාවන් කෙරෙහි යොමු කිරීමට හා පාසල් මට්ටමින් බිහිවන ක්‍රීඩකයින් ජාතික තලය දක්වා රැගෙන යාම සදහා ගෙන ඇති වැඩපිළිවෙල සම්බන්ධයෙන් ද මෙහිදී කරුණු විමසනු ලැබිණි. | 2025 වර්ෂය සඳහා පාසල් මට්ටමින් ක්‍රීඩා කුසලතා පෙන්නුම් කරනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රීඩා ශක්ති වැඩසටහන ආරම්භ කර ඇත.<br>ජාතික මට්ටමේ තරඟ වලදී ඉහල දක්ෂතා දක්වා ඇති කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ මට්ටමින් ක්‍රීඩා පුහුණුවේ නියැලෙන වයස අවුරුදු 16-20 අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන් වයස් කාණ්ඩ අනුව සංචිත සඳහා තෝරාගෙන ඇත. එමෙන්ම මෙම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පුහුණු කටයුතු ඉහළ මට්ටමින් පවත්වාගෙන යෑමට කටයුතු කිරීම තුලින් ජාතික සංචිත වලට සහ උසස් දක්ෂතා සංචිත සඳහා ඇතුලත්වීමේ අවස්ථාව ලබා දීමටත්, ක්‍රීඩා ශක්ති සංචිතය සඳහා තේරි පත්වී ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මසකට රු.10,000.00ක පෝෂණ දීමනාවක් ලබා දීමටත් කටයුතු කරනු ලැබේ.<br>2025 වර්ෂය සඳහා ක්‍රීඩා ශක්ති වැඩසටහන සඳහා තෝරාගෙන ඇති ක්‍රීඩා පහත පරිදි වේ. |

| අනු අංකය | ක්‍රීඩාව | කාන්තා | පිරිමි | එකතුව |
|---|---|---|---|---|
| 1 | මලල ක්‍රීඩා | 37 | 38 | 75 |
| 2 | බැඩ්මින්ටන් | 15 | 15 | 30 |
| 3 | පැසිපන්දු | 23 | 24 | 47 |
| 4 | බොක්සිං | 10 | 16 | 26 |
| 5 | කැරම් | 10 | 10 | 20 |
| 6 | හොකී | 20 | 20 | 40 |
| 7 | ජූඩෝ | 16 | 16 | 32 |
| 8 | කබඩි | 20 | 20 | 40 |
| 9 | කරාතේ දෝ | 12 | 16 | 28 |
| 10 | නෙට්බෝල් | 20 | - | 20 |
| 11 | මල්ලවපොර | 15 | 16 | 31 |
| 12 | ස්කොෂ් | 10 | 10 | 20 |
| 13 | මේසපන්දු | 21 | 21 | 42 |
| 14 | ටයිකොන්ඩෝ | 18 | 18 | 36 |
| 15 | වොලිබෝල් | 11 | 30 | 41 |
| 16 | බර ඉසිලීම | 20 | 20 | 40 |
| 17 | පිහිණුම් | 25 | 25 | 50 |
| 18 | වෙස් | 10 | 10 | 20 |
| 19 | වූෂු | 15 | 15 | 30 |
| 20 | ජිම්නාස්ටික් | 16 | 24 | 40 |
| 21 | පාපන්දු | 30 | 30 | 60 |
| 22 | මුළු සංඛ්‍යාව | | | 768 |

Aashumara

සුනිල් කුමාර ගමගේ
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය

සුනිල් කුමාර ගමගේ (පා.ම.)
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

ඇමුණුම A

## ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන රු. මි | වියදම් රු. මි | ව්‍යාපෘතිය ආරම්භ කල දි | නිම කල යුතු දිනය | දින දීර්ඝ කිරීම | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|---|---|
| 1 | උඩුබද්දාව පොදු ක්‍රීඩාංගණය සංවර්ධන ව්‍යාපෘතිය අවසන් අදියර | 6,060,000.00 | 6,332,700.00 | 2018.05.07 | 2018.12.09 | 2019.12.15 | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |
| 2 | මායාකච්චිම දුන්වත්ත පොදු ක්‍රීඩාංගණය සංවර්ධන ව්‍යාපෘතිය අවසන් අදියර | 11,735,050.00 | 12,589,573.74 | 2018.05.07 | 2018.12.01 | 2019.12015 | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |
| 3 | ටොරින්ටන් ප්‍රේක්ෂකාගාරය | 235,807,156.68 | 254,809,243.86 | 2018.05.01 | 2018.05.01 | 2021.11.30 | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |
| 4 | විලල ඒ රත්නායක මධ්‍ය මහා විද්‍යාලයේ පැතිබැම්ම ඉදිකිරීම | 8,963,400.00 | 6,987,453.78 | 2018.10.11 | 2019.07.03 | 2019.12.31 | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |
| 5 | ගාල්ල බද්දේගම ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය | 8,622,280.03 | 7,086,396,.47 | 2018.10.11 | 2018.10.15 | 2021.03.15 | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |
| 6 | බණ්ඩාරවෙල මහජන ක්‍රීඩාංගණයේ ක්‍රීඩාපිටිය | 58,031,123.70 | 58,031,123.70 | 2019.07.31 | 2019.0514 | 2020.12.31 | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |
| 7 | හාලිඇළ ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණය | 18,695,911.41 | 17,104,627.51 | 2019.16.10 | 2019.12.20 | 2021.04.30 | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |
| 8 | පිටිගංගණය මහජන ක්‍රීඩාංගණ ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම | 17,987.477.09 | 15,519,824.89 | 2019.06.10 | 2019.12.20 | 2021.06.30 | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |
| 9 | වැල්ලවාය ප්‍රාදේශීය සභා ක්‍රීඩාපිටිය | 11,108,995.00 | 9,509,675.45 | 2019.08.26 | 2020.02.26 | 2020.04.31 | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |
| 10 | යාලිය මහා විද්‍යාලය ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම - කරුවලගස්වැව | 8,883,963.50 | 7,991,630.70 | 2019.12.11 | 2019.12.11 | 2021.04.30 | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |
| 11 | සපුගස්කන්ද විශාඛා විද්‍යාලීය ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම | 13,398,031.50 | 6,512,959.64 | 2019.10.10 | 2020.08.21 | 2021.12.31 | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |
| | සපුගස්කන්ද විශාඛා විද්‍යාලීය ප්‍රේක්ෂකාගාරය ඉතිරිවැඩ | 3,853,825.00 | 3,875,101.30 | 2023.04.26 | 2023 07.16 | | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |
| 12 | ශාන්ත ජෝශප් විද්‍යාලීය පිහිනුම් තටාකය ඉදිකිරීම - අනුරාධපුරය | 43,005,000.00 | 49,378.679.51 | 2019.11.15 | 2020.03.10 | 2023.08.06 | නිමාවී ඇත 2023 /2024 හා 2025 මෙතෙක් කිසිදු දෝශ වාර් තා වී නැත |

DG,
හේතු සඳහන් කර
වාර්තාව එවන්.

ජී.එස්.බී. [illegible]
අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා)
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
අංක. 09, පිලිප් ගුණවර්ධන මාවත
කොළඹ 07.

CA
11/9/25

## ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි | ව්‍යාපෘතිය ආරම්භ කල දිනය | නිම කල යුතු දිනය | දින දීර්ඝ කිරීම | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|---|---|
| 13 | වවුනියා පිහිනුම් තටාකය | 43,298,420.00 | 30,293,157.51 | 2015.08.03 | 2016.05.03 | 2022.01.15 | නිම වී ඇත. 2023/2024 |
| 14 | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ක්‍රීඩාංගනය ඉදිකිරීම | 70,763,864.79 | 49,877,174.68 | 2015.08.03 | 2017.10.25 | 2021.12.31 | නිම වී ඇත. 2023/2024 |
| 15 | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ පිහිනුම් තටාකය හා ප්‍රේක්ෂකාගාරයඉදිකිරීම | 43,663,056.53 | 36,491,042.75 | 2015.08.03 | 2017.08.31 | 2021.12.31 | නිම වී ඇත. 2023/2024 |
| 16 | වවුනියා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ මීටර් 400 ධාවන පථය | 100,957,843.87 | 73,583,589.18 | 2015.08.03 | 2016.11.15 | 2022.03.31 | නිම වී ඇත. 2023/2024 |
| 17 | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය | 63,057,738.45 | 43,980,968.56 | 2018.12.24 | 2019.05.10 | 2021.12.15 | නිම වී ඇත. 2023/2024 |
| 18 | කල්මුනේ පිහිනුම් තටාකය හා ප්‍රේක්ෂකාගාරය | 53,201,509.96 | 28,769,240.70 | 2016.12.01 | 2017.09.16 | 2021.12.31 | නිම වී ඇත. 2023/2024 |
| 19 | පොළොන්නරුව ක්‍රීඩා සංකීර්ණයේ ටෙනිස් පිං වලල්ල ඉදිකිරීම | 46,563,269.12 | 44,962,720.73 | 2017.10.12 | 2018.10.29 | 2021.11.30 | නිම වී ඇත. 2023/2024 |
| 20 | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ශක්තිවර්ධන ශාලාව ඉදිකිරීම | 52,147,366.60 | 20,654,590.80 | 2019.02.12 | 2019.07.26 | 2022.01.31 | නිම වී ඇත. 2023/2024 |
| 21 | වවුනියා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීම | 147,100,177.60 | 100,886,379.31 | 2015.08.03 | 2017.08.31 | 2021.08.31 | නිම වී ඇත. 2023/2024 |
| 22 | වයඹ පළාත් ක්‍රීඩා සංකීර්ණයේ පිහිනුම් තටාකය | 84,399,475.00 | 68,995,095.54 | 2016.12.30 | 2018.06.05 | 2022.01.31 | නිම වී ඇත. 2023/2024 |
| 23 | වයඹ පළාත් ක්‍රීඩා සංකීර්ණයේ ප්‍රේක්ෂකාගාරය | 69,624,898.00 | 76,754,545.20 | 2016.12.06 | 2017.09.20 | 2021.12.31 | නිම වී ඇත. 2023/2024 |
| 24 | මාතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ නේවාසිකාගාරය | 196,854,231.13 | 192,459,721.73 | 2019.11.21 | 2020.11.21 | 2021.12.31 | නිම වී ඇත. 2023/2024 |
| 25 | පොළොන්නරුව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ නේවාසිකාගාරය | 196,854,231.13 | 194,296,301.64 | 2019.11.21 | 2020.11.21 | 2021.12.31 | නිම වී ඇත. 2023/2024 |
| 25 | මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ මීටර් 400 ධාවන පථය | 81,877,205.00 | 48,614,336.38 | 2015.08.03 | 2016.05.03 | 2022.03.31 | ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් ඇත |

ඇමුණුම B

<u>වැඩ නිම නොකර අතරමග නවතා දමා තිබූ ව්‍යාපෘති</u>

| අනු අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය රු.මි.(වැට් සහිත) | වියදම(වැට් සහිත) | ව්‍යාපෘතිය ආරම්භකල දිනය | නිමකළ යුතු දි | දින දීර්ඝ කිරීම | නියමිත දිනට නිම නොකිරීමට හේතු | අත්හැර දැමීමට හේතු | අතරමග නතර කරන විට පැවති තත්වය | වර්තමාන තත්වය | වැඩ අවසන් කිරීමට අපේක්ෂිත දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වලිහවුස්(විටස්වයින් පාර්ක් ක්‍රීඩා සංකීර්ණය කොළඹ 15 | 68,637,821.59 | 27,436,192.77 | 2018.06.14 | 2019.01.10 | - | වැඩ බිමේ ස්ථානය වෙනස්වීම හේතුවෙන් අමතර වැඩ ඇතුලත්ව කොන්ත්‍රාත් වටිනාකම ඇතුලත නව සැලැස්ම සහ නව ප්‍රමාණපත්‍ර සකස් කිරීමට වැඩිකාලයක් ගතවීම | මෙහි ප්‍රතිපාදන නොමැති වීම හා කොන්ත්‍රාත් ආයතනය හා උපදේශක ආයතනය වන කොළඹ මහ නගර සභාව සමග ඇති වූ ගැටළුකාරී තත්වයක් නිසා තාවකාලිකව ඉදිකිරීම් නතර කර ඇත. | ඇත්තිවාරම් කපා columns සකස් කර ඇත | මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. | |
| 2 | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය අමතර වැඩ | 45.616.714.32 | 1.060.095.84 | 2019.08.10 | 2019.12.24 | - | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ ඇතිවූ ගැටළු සහගත තත්වය හේතුවෙන් ඉදිකිරීම් නතර කිරීම | මෙම ව්‍යාපෘතිය ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ඉදිකිරීම සඳහා පවරා තිබූ අතර ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ ඇතිවූ ගැටළු සහගත තත්වය හේතුවෙන් එම ආයතනය මගින් ඉදිකිරීම් අතර මග නවතා දැමීම නිසා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් අනුමැතිය ලබා එම හිඩැසුම අහෝසි කරන ලදි.ඒ සඳහා නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට කටයුතු කරන ලදි.2022 වර්ෂයේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම මත ඉදිකිරීම් තාවකාලිකව නතර කිරීමට තීරණය ලබා දෙන ලදි. | පිවිසුම් මාර්ගයේ මූලික අඩියර අරඹා කර නතර කර ඇත | ව්‍යාපෘතිය නතර කර ඇත | |
| 3 | මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය-ශක්ති වර්ධන ශාලාව | 34.535.945.76 | 5.000.000.00 | 2019.06.24 | 2019.10.08 | - | | | අලුතින් ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ලේ පැරණි බිත්ති කඩා ඉවත් කර ඇත | | |
| 4 | මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය අමතර වැඩ | 20.183.686.55 | 3.900.578.02 | 2019.06.24 | 2019.09.08 | - | | | ආරම්භ කර නොමැත | | |
| 5 | මොණරාගල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 557.026.490.56 | 19.050.845.95 | 2019.07.22 | - | - | ප්‍රතිපාදන නොමැති බැවින් ඉදිකිරීම් නවතා දැමීමට තීරණය කිරීම | 2021.2022 .2023වර්ෂ සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් ඉදිකිරීම් නවතා ඇත. | ක්‍රීඩාංගනය ඉදිකිරීමේ දී මතුවූ කළුගල් කඩා ඉවත් කර ඇත. | 2023වර්ෂය සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් ඉදිකිරීම් ආරම්භ කර නොමැත | |
| 6 | නැගෙනහිර පළාත් ක්‍රීඩා සංකීර්ණය | 342.086.061.01 | 235.180,000.00 | 2013.02.28 | 2015.02.28 | 2016.04.30 | කැනීම් කිරීමේදී ජිනිප් ඇට කටු හමු වීම නිසා උසාවි තහනම් නියෝගක් මත ඉදිකිරීම් නතර කිරීමට සිදු විය | මීටර් 400 ධාවන පථය හා ප්‍රේක්ෂකාගාරය,ක්‍රිකට් ක්‍රීඩා පිටියේ ඉදිකිරීම් තාවකාලිකව නතර කර ඇත.ඊට හේතුව වනුයේ කැනීම් කිරීමේදී ජිනිස් ඇට කටු හමු වීම නිසා උසාවි තහනම් නියෝගයන් ලැබීම නියාය ඉදිකිරීම් ආරම්භ කිරීමට 2022.07.30 දින ලබා දී ඇති තීන්දුවට අනුව නඩු වාර්තාවේ පිටපතක් ඉල්ලා ඇති නමුත් මෙතෙක් එය ලැබී නොමැත. | 2016 වර්ෂයේ පිහිනුම් තටාකය සහ ගෘහස්ථ ක්‍රීඩාගාරයේ වැඩ අවසන් කර ත්‍රිකුණාමලය නගර සභාව වෙත භාරදී ඇත. | 2024 වර්ෂයේ ඉදිකිරීම ආරම්භ කිරීම සඳහා අයවැය මගින් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 7 | [illegible] ක්‍රීඩාගාරය | 168,134,270.38 | 45,261,635.30 | 2019.10.31 | 2020.10.31 | 2022.05.15 | කොවිඩ 19 වසංගත තත්වය හේතුවෙන් අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටළු ඇතුවීම නිසා කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් ආරම්භ නොකිරීම,ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් ගෙවීම ප්‍රමාද වීම. | අපෙක්ෂිත ගිවිසුමක් අත්සන් කර ඉදිකිරීම් 2022.05.15 දින අවසන් කිරීමට කොන්ත්‍රාත් කරු එකඟ වුවද කොවිඩ වසංගතය තිබූ කාලයේ අදාලව මිල විචලනයන් සඳහා 20% දක්වා මිල උච්චාවචනයන් ඉල්ලුම් කල අතර 10% දක්වා පමණක් මිල උච්චාවචනය ලබාදීමට අනුමැතිය ලැබුණු අතර කොන්ත්‍රාත් කරු එයට එකඟ නොවීම. නිසා ඉදිකිරීම් ආරම්භ කර නොමැත. | Soil improvement Column Base ඉදිකර ඇත. | ඉදිරියේදී Termination කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. | |
| 8 | [illegible] ගෘහස්ථ ක්‍රීඩාගාරය | 192,688,966.40 | 190,258,806.91 | 2017.08.11 | 2018.08.25 | 2022.08.31 | මූලික සැලසුම් වෙනස්වීම හා උපදේශන ආයතනය හා කොන්ත්‍රාත් ආයතනය සමග ඇතිවූ ගැටළු තත්වයට විසඳුම් නොමැතිවීම නිසා ඉදිකිරීම් ප්‍රමාද විය. | මිලවිචලනයන් හා බිල්පත් සඳහා කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් ප්‍රමාද වීම නිසා ඉදිකිරීම් නතර කරන ලද කොන්ත්‍රාත්කරු දක්වන ලද.2022.12.29 දෙපාර්තමේන්තුවේ එකඟතාව මත වෘත්තීය අත්හිටුවා ඇත | වහලය සඳහා සකස් කර ඇති truss එක රඳවා ලී පොළව සකස් කිරීමට ඇත. | 2023.04.26 දින ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාර ගෙන ඇත. ක්‍රීඩාගාරයේ වහලය සකස් කිරීම හා ලී පොළව සකස් කිරීම ඇත.ඒ සඳහා CECB ආයතනය මගින් මි.500.00 ක ඇස්තමේන්තුවක් අම්පාර වැඩ සඳහා ඉදිරිපත් කර ඇත.අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අනුමැතිය ලබාගෙන විවෘත මිලගණන් කැඳවා නැවත ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. | |
| 9 | මහරගම ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය | 177,227,801.66 | 48,714,039.36 | 2015.08.03 | 2016.05.03 | 2022.03.31 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ඉදිකිරීම් ප්‍රදේශය පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ප්‍රදේශයක් ලෙස නම්කල හෙයින් අවශ්‍ය සීමා මායිම් නිර්ණය කර ගැනීම සඳහා ඉදිකිරීම් තාවකාලිකව නතර කිරීමට උපදෙස් දෙන ලදී. | ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව රටේ පවතින ආර්ථික තත්වය අමුද්‍රව්‍ය හිඟය මත වැඩ නතර කර ඇත. | පොළවේ සිට කණු ඉදි කර ඇත. (footing & columns) | 2024 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා අයවැය මගින් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. | |
| 10 | මහරගම පිහිනුම් තටාකය හා ප්‍රේක්ෂකාගාරය | 53,139,423.23 | 31,327,993.28 | 2015.08.03 | 2017.01.27 | 2022.03.31 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ඉදිකිරීම් ප්‍රදේශය පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ප්‍රදේශයක් ලෙස නම්කල හෙයින් අවශ්‍ය සීමා මායිම් නිර්ණය කර ගැනීම සඳහා ඉදිකිරීම් තාවකාලිකව නතර කිරීමට උපදෙස් දෙන ලදී. | ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව රටේ පවතින ආර්ථික තත්වය අමුද්‍රව්‍ය හිඟය මත පිහිණුම් තටාකයේ වැඩ නතර කර ඇත. | Structural Work, Roof Finishing Work) ව්‍යුහාත්මක වැඩ, වහල නිම කිරීමේ වැඩ අවසන් කර ඇත | 2024 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා අයවැය මගින් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. | |

ඒ.එස්.බී. විජේසූරිය
අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා)
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
අංක. 09, පිලිප් ගුණවර්ධන මාවත
කොළඹ 07